# Abstract 36

## බෞද්ධ කලා කෘතිවලින් ප්‍රකට වන සන්නිවේදනය

**ජී. ඩී. සුගාරි කාංචනා,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*Gdskanchana66@gmail.com*

බුදුසමයයෙන් පෝෂණය ලද ලාංකේය කලා කෘති අපූර්වතම සන්නිවේදන මාධ්‍යයන් ලෙස අතීතයේ පටන් ම පැවත ඇත. මෙම පර්යේෂණයෙහි අභිමතාර්ථය වන්නේ බෞද්ධ කලා කෘති තුළින් විශද වන්නා වු ධර්ම සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ ගවේෂණයක් කිරීම යි. මූලික වශයෙන් මෙහි දී චෛත්‍ය, සඳකඩපහණ, බුද්ධ ප්‍රතිමාව හා බෞද්ධ චිත්‍ර ආදිය පිළිබඳ අවධානයට ලක් කෙරේ. වර්තමාන සමාජය තුළ සෞන්දර්ය රසාස්වාදය ක්‍රමානුකූලව හීන වී ගොස් ඇති බව ප්‍රකට කරුණක් වන අතර බෞද්ධ කලා කෘතිවලින් පැණෙන සන්නිවේදන ක්‍රම මිනිසා තුළ ආගමික සමෘද්ධිය පොහොසත් කිරීම උදෙසා කෙතරම් දුරට ඉවහල් වන්නේ ද යන්න පිළිබඳ අනාවරණය කිරීමට ද අපේක්ෂා කෙරේ. බෞද්ධ කලාවේ මූලික අභිමතාර්ථය වන්නේ මිනිසා නිර්වාණ මාර්ගයට රැගෙන යාම පමණක් ම නොවේ. එයින් ආධ්‍යාත්මික වින්දනයක් ද ජීවිතාවබෝධය ද ස්වීය උරුමයන් පිළිබඳ අභිමානය ද නිසැකව ම වර්ධනය වේ.

**ප්‍රමුඛ පද :** අවබෝධය, අධ්‍යාත්මික වින්දනය, උරුමය, කලා කෘති, රසාස්වාදය